
## 2.19 ඩොමිනෝ කට්ටලය




හැදින්වීම:- කැට පද්ධතියේ සම්පූර්ණ වශයෙන් කැට 49කින් යුක්ත වෙයි. තව ද කැට පද්ධතියේ පසුපස වර්ණ 3කින් යුක්ත වෙයි. ඩොමිනෝ ක්‍රීඩාව සඳහා සැකසූ උපකරණයකි.


ඩොමිනෝ කැට පද්ධතිය අනුසාරයෙන් සිදු කළ හැකි ක්‍රියාකාරකම්

- ❖ කැට පද්ධතියේ පසුපස වර්ණය අනුව කාණ්ඩ 3කට මෙම කැට පද්ධතිය වෙන් කළ හැකිය.
- ❖ අඩුම කැට සංඛ්‍යාවක් සහිත ගොඩේ ඇති කැටවල අය ගණන් නිරීක්ෂණය කර එහි විශේෂත්වය සඳහන් කරන්න.
- ❖ ඩොමිනෝ කැට පද්ධතිය රැගෙන පහත අනුපිළිවෙළට සකස් කරන්න. එවිට එහි ඇති කැට පිළිබඳවත් එම කැටවල අඩුවක් හෝ වෙනසක් ඇතිනම් ඒ පිළිබඳව අවබෝධයක් ඇතිවනු ඇත. එම අඩු කැටවලට ආදේශක තැබිය හැකිය.

<u>ඩොමිනෝ මුහුණත් නීතිය</u>

ඩොමිනො කැට භාවිතයෙන් විවිධ රටාවන් නිර්මාණය කළ හැකියි. එම නිර්මාණයේ දී පොදු නීතියක් ඇත. මෙය ඩොමිනෝ මුහුනත් නීතිය ලෙස හඳුන්වයි. එනම් ඩොමිනෝ කැට පෙල ගැස්වීමේ දී එකිනෙක හමුවන මුහුණත් දෙකම එකම අගයක් විය යුතුය.


උදා:



<u>ඩොමිනෝ සංඛ්‍යා ශ්‍රේණි සැකසීම</u>


කැටයක කොටස් දෙකකි අගයන්ගේ එකතුව 0,1,2,3....................12 වන පරිදි ඩොමිනෝ ශ්‍රේණියක මුහුණත් නීතියට එකඟවන පරිදි කැට තෝරා ශ්‍රේණියක සැකසිය හැකිය.

උදා:





<u>ඩොමිනෝ ඔත්තේ ශ්‍රේණිය සැකසීම</u>

කැටයක කොටස් දෙකේ අගයන් වල එකතුව 1,3,5..........11 වුවද ඩොමිනෝ ශ්‍රේණියක මුහුණත් නීතියට එකඟ වූද කැට ශ්‍රේණිය ඩොමිනෝ ඔත්තේ ශ්‍රේණියයි.




<u>ඩොමිනෝ ඉරට්ටේ ශ්‍රේණිය සැකසීම</u>


කැටයක කොටස් දෙකේ අය ගණන්වල එකතුව 0,2,4,6..........12 වූද ඩොමිනෝ මුහුණත් නීතියට එකඟ වූද ශ්‍රේණියක් ඩොමිනෝ ඉරට්ටේ ශ්‍රේණියකි.




<u>මැජික් සමචතුරස්‍ර සෑදීම</u>

මැජික් චතුරස්‍රයක පේළි තීර හා විකර්ණයන් හි අය ගණන්වල එකතුව එකම අගයක් වීම මෙහි නීතියයි.පහත උදාහරණය මගින් මේ පිළිබඳව තවදුරටත් අවබෝධ කරගන්න.මෙහි දී පළමුවකැට පිහිටුවීමත් දෙවනුව එය සටහනක් ලෙස ඉදිරිපත් කිරීමක් කළ යුතුයි.

කැට පිහිටුවීම




සටහන

| | | | |
|---|---|---|---|
| 2 | 0 | 3 | 6 |
| 6 | 4 | 1 | 0 |
| 1 | 2 | 4 | 4 |
| 2 | 5 | 3 | 1 |

පැත්තට කොටු 3ක් සිටින සේ පහත ඡේදයේ පරිදි තබන්න.කොටු 3නේ අයගණන් වල එකතුව සෑම පැත්තකම එකම අගයක් ගත යුතුයි.

පැත්තක අය ගනන්වල එකතුව 10 කි. ( මෙය ඩොමිනෝ මුහුණත් නීතියට අනුකූල නොවේ. නීතියට අනුකූලව සකසන්න උත්සහ කරන්න.)

20ට අඩු සංඛ්‍යා සඳහා සමචතුරස්‍ර සැකසීමට උත්සාහ කරන්න.කිසියම් අගයක් සෑදීමට නොහැකි නම් එය අතහැර වෙනත් අගයක් සඳහා සකස් කරන්න උත්සහ කරන්න මෙහිදී පැතිවල අගය එකම අගයක් වන සේ සැකසීමේදී ඩොමිනෝ මුහුණත් නීතියට අනුකූල වන සේ විය යුතුය. පහත උදාහරණය සැලකිල්ලට ගන්න.




- ❖ කැට ගණන 12/16/20/24 ලෙස ගෙන තවදුරටත් සමචතුරස්‍ර සාදන්න උත්සාහ කරන්න.